දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. ) DPRD/A/36/2020

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය ) 10.11.2020
திகதி )
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
## சுகாதார அமைச்சு
## Ministry of Health

---

## මාධ්‍ය නිවේදනය

**අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා දැඩි සංචරණ සීමාවන් පනවා ඇති**
**<u>ප්‍රදේශවලින් කාර්ය මණ්ඩලය ගෙන්වා ගැනීම</u>**

ඉහත කරුණ යටතේ මවිසින් නිකුත් කරන ලද 2020.11.09 දිනැති මාධ්‍ය නිවේදනයට වැඩිමනත් වශයෙනි.

කොවිඩ් මර්දන කටයුතු පහසු කරවීම සඳහා දිවයිනේ තෝරාගත් ප්‍රදේශ ගණනාවක දැඩි සංචරණ සීමා පනවා ඇත. මේ හේතුවෙන් එම ප්‍රදේශවලට හෝ එම ප්‍රදේශවලින් පිටතට මහජන සංචරණය දැඩිලෙස සීමා කර ඇත. මෙම සීමාවන් ආර්ථික කටයුතු සහ එදිනෙදා ජන ජීවිතය පවත්වාගෙන යාමට අදාල ක්‍රියාවලියන් සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලයට සහ අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා වන කාර්ය මණ්ඩලයට අදාල නොවේ.

ඒ අනුව ඉහත ක්‍රියාවලියන් හැර වෙනත් කටයුත්තක් සඳහා සංචරණ සීමා පනවා ඇති ප්‍රදේශ වලින් කාර්ය මණ්ඩලය ගෙන්වා ගැනීම අත්‍යවශ්‍ය වූ අවස්ථාවලදී ඒ පිළිබඳව තොරතුරු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඒ ඒ අවස්ථාවට අනුකූලව අවසර ගත යුතු බව දන්වා සිටී.

මේ සඳහා නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා I ) වෙත ෆැක්ස්(0112671660) පණිවිඩයක් යැවිය යුතුය. වැඩිදුර විමසුම් සඳහා 0117966366 ඇමතිය යුතුය.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

2020.11.10

---